# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத மெதுர", காணி செயலகம், 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
Fax 011 286 4051

මගේ අංකය / எனது இல. / My No. } උපදෙස් පත්‍රිකා අංක 7020/04
ඔබේ අංකය / உமது இல. / Your No }
දිනය / திகதி / Date } 2011/10/03

ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු,
අන්තර් පළාත් (ඉඩම් කොමසාරිස්වරු/ සහකාර ඉඩම් කොමසාරිස්වරු)

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන දීමනාපත්‍ර</u>**

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය හා නිරවුල් ඉඩම් හිමිකම ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව පුද්ගලයන් වෙත බැහැර කරන රජයේ ඉඩම් ආර්ථික ඒකක ලෙස වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන එම ඉඩම් පරිහරණ සම්බන්ධව තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ අවශ්‍යතාවය අනුව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දීමනාපත්‍ර සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ එවීමේදී දැනට භාවිතා කරනු ලබන ආකෘතිය 01 හා 02 සඳහා අවශ්‍ය තොරතුරු ඇතුලත් කර සංශෝධනය කර සකස් කරන ලද ආකෘති අංක 01 මේ සමඟ අමුණා ඇත. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව දීමනාපත්‍ර සකස් කිරීමේදී හා කොන්දේසි සංශෝධනය කර නව දීමනාපත්‍ර සකස් කිරීම සඳහා ඉදිරියට නිර්දේශ එවීමේදී එම සංශෝධිත ආකෘතිය යොදා ගැනීමට කටයුතු කරන්න.

තවද රජයේ ඉඩම් කළමනාකරණ පද්ධතිය (E - Slims) මඟින් නිර්දේශ එවීමේදී මෙම ආකෘතිය ඇමිණුම සඳහා ඇතුලත් කර ඉදිරියේදී අදාල නිර්දේශ එවීමට කටයුතු කළ යුතු බැවින් ඉදිරියේදී සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල රජයේ ඉඩම් කළමනාකරණ පද්ධතිය හරහා ඉඩම් සංවර්ධන ආඥා පනතේ දීමනාපත්‍ර සඳහා නිර්දේශ එවිය යුතු බවත් අවධාරණය කරමි.

මෙහිදී මෙම ආකෘතියේ 01 හි (2) කොටසේ ස්වභාවය පරීක්ෂා කිරීමේදී, ඉඩමේ පරිහරණය සම්බන්ධව (viii) කොටසේ සඳහන් පරිදි නේවාසික, නේවාසික හා වගා හා කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීම පිළිබඳව සඳහන් කළ යුතුය. එහිදී හැකි නම් අදාල වගා කර ඇති බෝග වර්ගය සඳහන් කිරීම අනිවාර්ය වේ.

1. නේවාසික - ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව හා පදිංචි පවුල් සංඛ්‍යාව
2. නේවාසික හා වගාව - ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව හා පදිංචි පවුල් සංඛ්‍යාව, වගාකර ඇති බෝගය හා ස්වභාවය (ස්ථිර බෝග/ කෙටිකා බෝග / මිශ්‍ර බෝග)
3. කෘෂිකාර්මික - වගාකර ඇති බෝගය හා ස්වභාවය (ස්ථිර බෝග / කෙටිකා බෝග / මිශ්‍ර බෝග )

ඉඩමේ සතර මායිම් දැක්වීමේදී පිඹුරේ කැබලි ලැයිස්තු විස්තරය අනුව මායිම් දැක්විය යුතු අතර බලපත්‍රය සඳහා අවස්ථාවේ ස්වභාවික මායිම් යොදා ඇත්නම් එය පිඹුරේ දැක්වෙන මායිම් අනුව බලපත්‍රය හා ලෙජරයේ අදාල සංශෝධන සිදුකර අමුණා එවිය යුතු අතර, පිඹුරට අදාල කැබලි ලැයිස්තු විස්තරය ඇමිණුමක් ලෙස රජයේ ඉඩම් කළමනාකරණ පද්ධතිය (E - Slims) වෙත ඇතුලත් කළ යුතුය.

ඉදිරියේ දී ඔබ විසින් ඉදිරිපත් කරන සියලුම නිර්දේශයන් සඳහා ඉඩමේ පරිහරණය රටාව ආකෘතිය 01 අනුව ඇතුලත් කළ යුතු බව ද කාරුණිකව දන්වා සිටිමි. ඒ පිළිබඳව යම් ගැටළුවක් පවතිනම් කරුණාකර මා විමසන්න.

(අත්සන)
ආර්.එම්.ඩී.එම්. [illegible]
ඉඩම් කොමසාරිස් ජනරාල්

පාලන / நிர்வாக / Admin ☎ 011 279 7479 Fax 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 Fax 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 Fax 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 Fax 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 748. Fax 011 288 36.
E-mail - landcom@landcomdept.gov.lk ... Web Address - www.landcomdept.gov.lk

Scanned by CamScanner